**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ඌන බිල්කිරීම රු. 3,786,571 ක් සඳහා හා ඉකුත් වර්ෂ 03 කට අදාල උසාවි දඩ ඌන හා අධි බිල්කිරීම් පිළිවෙලින් රු. 1,717,376 ක් හා රු. 793,291 ක් සඳහා ගැලපීම් කර නොතිබීම හේතුවෙන් ලැබිය යුතු ගිණුම් වල හා සමුච්චිත අරමුදලේ ශේෂය එම වටිනාකම් වලින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාල ගැලපීම් කර ගිණුම් නිවැරදි කරගත යුතුවේ. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට ක්‍රියා කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල කඩකුලිය රු. 81,000 ක් අඩුවෙන් බිල්කර තිබීම හේතුවෙන් මෙහෙයුම් ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 37,150,895 ක වෙනසක් විය. | නොසැසඳීම් වලට අදාල හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතුවේ. | ලේඛන පරීක්ෂා කර බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.4 අනුකූල නොවීම
**-------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**
**---------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2008 වර්ෂයේ සිට පැවත එන රු. 732,322 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ සිට පැවති තැන්පතු ගෙවී ඇත්දැයි පරීක්ෂා කර බලා ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 06 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නියමිත පරිදි ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය IV (ආ) කොටසේ 5(5) වන අතුරු ව්‍යවස්ථාව | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුල හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 15 ක් ඉවත් කිරීමට හෝ නියමානුකූල කිරීමට පියවර ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් යොමුගත විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනවසර ඉදිකිරීම් සම්බන්ධව මහා සභාවට ඉදිරිපත් කර ඇති අතර, නැවත කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂාවන් සිදුකර අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. |
| (ඇ) | පළාත් පාලන ආයතන වල හිඟ වරිපනම් බදු සහ අක්කර බදු එකතු කිරීම සඳහා නිලධාරීන් යෙදවීම හා කොමිස් මුදල් ගෙවීම සම්බන්ධයෙන් වූ පළාත් පාලන කොමසාරිස්ගේ 2017 මැයි 11 දිනැති අංක 5/10/2017 දරන චක්‍රලේඛයේ 03 වන ඡේදය | හිඟ වරිපනම් සඳහා අය කරනු ලබන වරෙන්තු ගාස්තුවට වඩා අඩු ප්‍රමාණයක් කොමිස් වශයෙන් ගෙවිය යුතු වුවද, 2015 ජූලි සිට අධි ගාස්තු/වරෙන්තු රහිතව රැස් කර තිබූ හිඟ වරිපනම් වෙනුවෙන් රු. 151,056 ක් කොමිස් ගෙවා තිබුණි. | අවිධිමත්ව කරන ලද ගෙවීම් අයකරගත යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 5/10/2017 දරන හා 2017 මැයි 11 දිනැති චක්‍රලේඛයේ 03 වන පරිච්ඡේදයට අනුව ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඉ) | 2018 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.1.9 මාර්ගෝපදේශය | (i) සමිතියක් විසින් එක් අවස්ථාවකදී ඉටු කරනු ලබන කොන්ත්‍රාත් වල එකතු වටිනාකම රු. 2,000,000 ක් නොඉක්මවිය යුතු වුවද, සමිති 02 ක් වෙත එම සීමාව ඉක්මවා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත ඉටු කිරීම සඳහා සමිති කිහිපයක් වෙත දැනුවත් කිරීම් සිදු කළද ඒ සඳහා වෙනත් කිසිදු සමිතියක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් වූ සමිති දෙකට කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කරන ලදී. |
| | | (ii) පිළිගත් සමිතියක් විසින් කිසියම් අවස්ථාවකදී ඉටු කරනු ලබන කොන්ත්‍රාත් ප්‍රමාණය 03 කට සීමාවිය යුතු වුවත්, එක් සමිතියක් වෙත 2018 දෙසැම්බර් මස කොන්ත්‍රාත් 04 ක් ප්‍රදානය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | වෙනත් කිසිඳු සමිතියක් ඉදිරිපත් නොවූ බැවින් සහ 2018 වර්ෂය වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන ලබා ගැනීමට නොහැකි වුවහොත් එම ප්‍රතිපාදන අවලංගු වන බැවින් ඉදිරිපත් වූ එකම සමිතිය වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 52,068,200 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 42,938,198 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2003, 2004, 2007 හා 2018 වර්ෂයන්ට අදාල බැංකුගත නොවූ මුදල්, චෙක්පත් හා ප්‍රේෂණ එකතුව රු. 586,385 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි. | බැංකුගත නොවූ මුදල් චෙක්පත් හා ප්‍රේෂණ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නිරවුල් කරගත යුතුයි. | බැංකු සැසඳුම් වාර්තාවට අදාළව 2006 වර්ෂයට පෙර බැංකු ප්‍රකාශ ලබා ගැනීමට හැකියාවක් නොමැති බව ස්ථිරවම තහවුරු වී ඇති බැවින්, එම කාලයට අදාල ගනුදෙනු කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත. මෙම ගනුදෙනු හඳුනාගැනීමට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට ලිපියක් යොමු කර ඇත. |
| (ආ) | 1999 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ කාලයට අදාල එකතුව රු. 109,562 ක් වූ හඳුනානොගත් හර කිරීම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | අදාල ගනුදෙනු හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුවේ. | |
| (ඇ) | 1993 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුල බැංකුවට බැර වී ඇති එකතුව රු. 149,734 ක් හඳුනාගෙන මුදල් පොතෙහි අදාල ගැලපීම් සිදුකර නොතිබුණි. | අදාල ගනුදෙනු හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුවේ. | |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,830,252 | 2,538,595 | 6,259,218 | 6,301,614 | 6,605,752 | 6,648,612 | 6,781,723 | 8,860,800 |
| (ii) | කුලී | 2,586,000 | 825,945 | 2,019,230 | 1,922,358 | 2,078,640 | 1,855,444 | 2,071,623 | 1,402,993 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 565,500 | 2,947,167 | 715,008 | 295,155 | 464,000 | 763,880 | 737,130 | - |
| (iv) | වෙනත් ආදායම් | 14,136,800 | 42,423,381 | 15,450,862 | 22,093,951 | 13,172,000 | 14,175,199 | 8,901,345 | 23,273,718 |

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් ශේෂය රු. 4,092,988 ක් තුල වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන වරිපනම් ඒකක 674 කට අදාල එකතුව රු. 1,344,188 ක ශේෂයක් පැවතුණි. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා විධිමත් හා කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | 2018 වර්ෂයේ ආදායම් පරීක්ෂක තනතුරු දෙකම පුරප්පාඩුව පැවතුණි. මේ වනවිට නව ආදායම් පරීක්ෂකවරියක පත්වීම් ලබා පැමිණි බැවින් හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු අක්කර බදු ශේෂය රු. 67,555 ක් තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 57 කට අදාල රු. 55,520 ක ශේෂයක් පැවතුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයේදී අක්කර බදු ලේඛනයේ සඳහන් දේපල පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නිවැරදිව දේපල හඳුනා ගැනීමෙන් පසුව හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාල කර්මාන්ත බදු රු. 65,680 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකර ගෙන නොතිබුණි. | හිඟ කර්මාන්ත බදු කඩිනමින් අයකරගත යුතුවේ. | හිඟ මුදල් මෙම වසරේ අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.3.3 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුල කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අය කල යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට ගාස්තු ගෙවා තිබූ ව්‍යාපාර ආයතන 919 කට 2018 දෙසැම්බර් වනවිටත් බලපත්‍ර ලබාදීමට සභාව අපොහොසත් වී තිබුණි. | බලපත්‍ර ලබාගත යුතු සියළුම ආයතන වෙත නියමිත කාල සීමාවක් ඇතුලත බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | බල ප්‍රදේශය තුළ කර්මාන්ත/ ව්‍යාපාර සම්බන්ධව සමීක්ෂණ කටයුතු මෙම වසර තුළ සිදු කරමින් පවතින අතර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු කරමි. |
| (ආ) | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු ආයතන 68 ක් එම බලපත්‍ර ලබාගෙන නොතිබීම හේතුවෙන් රු. 299,200 ක ආදායමක් සභාවට අහිමි වී තිබූ අතර, අදාල බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත හඳුනාගැනීමට වාර්ෂික සමීක්ෂණයක් හෝ වෙනත් විධිමත් | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන වෙත අදාල විධිවිධාන ප්‍රකාරව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ආයතන සඳහා ලිඛිත දැනුම්දීම් කර ඇති අතර, පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කරන ලෙස ආදායම් පරීක්ෂකවරිය දැනුවත් කර ඇත. |

ක්‍රමවේදයක් සභාව විසින් අනුගමනය කර නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු පිළිබඳ සමාලෝචිත වර්ෂය තුල සමීක්ෂණයක් සිදුකර නොතිබීම හේතුවෙන් ප්‍රදර්ශනය කර ඇති සියළු දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයවී තිබේද යන්න පිළිබඳ තහවුරුවක් සභාව සතුව නොවීය. | දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර ගාස්තු අයකර ගැනීමටත් ලැබිය යුතු සියළු ආදායම් රැස්කර ගැනීමටත් ක්‍රියාකළ යුතුවේ. | දැන්වීම් පුවරු පිළිබඳ ඉදිරියේදී සමීක්ෂණයක් සිදුකර මුදල් අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | බල ප්‍රදේශය තුල පිහිටි සංචාරක හෝටල් 03 කින් එම හෝටල් වල වාර්ෂික පිරිවැටුම මත අයකර ගතයුතු සියයට 01 ගාස්තු අයකරගෙන නොතිබුණි. | අදාල හෝටල් වලින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී අදාල ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති උසාවි දඩ ආදායම රු. 1,898,165 ක් වූ අතර, 2016 වර්ෂයට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 15,195,339 ක් විය. 2017 හා 2018 වර්ෂ සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම සභාව හඳුනාගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පැල්මඩුල්ල අධිකරණයෙන් 2018 ජූලි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු උසාවි දඩ මුදල රු.1,280,250 ක් ලෙස හඳුනාගෙන ඇති අතර, එම මුදල් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.<br>2017, 2018 වර්ෂ සඳහා අදාළ වන මුද්දර ගාස්තු උපලේඛන මේ වනවිටත් ලැබී නොමැති බැවින් එම වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගැනීමට හැකියාවක් නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | දිගුකාලීන සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දිගුකාලීන සැලසුම් ඉදිරි වර්ෂයේදී සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2013 ජුනි මස සිට පුරප්පාඩුව පැවතුණු සභා ලේකම් තනතුර සඳහා 2019 වර්ෂයේදී වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු අනුයුක්ත කර තිබුණි. සභාවේ අනුමත ආදායම් පරීක්ෂක තනතුරු දෙකෙන් එක් තනතුරක් අනුමත වූ දින සිටම පුරප්පාඩු වී තිබීම සභාවේ ආදායම් රැස් කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 අප්‍රේල් 01 දින සිට වැඩ බලන ලේකම්වරයෙකු පත්කර ඇති අතර, එක් ආදායම් පරීක්ෂකවරියක් රාජකාරී කටයුතු භාරගෙන ඇත. |
| (ආ) | 1996 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලයට අදාල එකතුව රු. 148,830 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තොරතුරු සොයාගත හැකි වූ අය සඳහා ලිපි යැවීමට කටයුතු කළ අතර, අනෙකුත් අයගේ තොරතුරු සොයාගත නොහැක. මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර ඇත. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් සභාවේ සිටි මන්ත්‍රීවරුන්ට වැඩිපුර ගෙවා තිබූ මන්ත්‍රී දීමනා රු. 16,500 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද අයකරගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුවේ. | මන්ත්‍රීවරුන්ට වැඩිපුර ගෙවා තිබූ මන්ත්‍රී දීමනාව වන රු. 16,500 ක මුදල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1993 වර්ෂයේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් සභාවට ලබාදී තිබූ එහෙත් අයිතිය විධිමත්ව පවරාගෙන නොමැති කැබ් රථයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තරමට දිරාපත් වී තිබුණද, එහි අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළුව නිරවුල් කරගෙන අපහරණය කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | වාහනයේ අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළු නිරවුල් කරගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදාල වාහනය සභාව වෙත පවරා ගැනීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත යොමුකර ඇති නමුත් පවරාදීම් සිදු වී නැත. මේ සම්බන්ධයෙන් උපදෙස් පතා පළාත් පාලන කොමසාරිස් තුමාට ලිපි යොමුකර ඇත. |

**3.5 ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හල්ගස් වෙල්යාය වේල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය 2018 දෙසැම්බර් 31 දිනට පෙර, වැඩ නිම කිරීමේ එකඟතාවය මත 2018 දෙසැම්බර් 14 දින ග්‍රාම සංවර්ධන සමිතියක් වෙත රු. 300,000 ක වටිනාකමකට පවරාදී තිබුණි. 2019 පෙබරවාරි 12 දින වනවිට වැඩ නිමි වටිනාකම රු. 24,921 ක් පමණක් වුවද, කොන්ත්‍රාත්කරුට එරෙහිව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට එරෙහිව කටයුතු කළ යුතුවේ. | ගිවිසුම්ගත කාලය තුල කර්මාන්තය නිම කිරීමට අදාළ සමිතියට නොහැකි වී ඇත. සාධාරණ හේතු ඉදිරිපත් කර දින දීර්ඝ කර ගැනීමේ ලිඛිත ඉල්ලීමක් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීම අදාළ ග්‍රාම සංවර්ධන සමිතියේ වගකීමකි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03 කට අදාලව එකතුව රු. 423,604 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කළ යුතුවේ. | අවශ්‍යතාවයක් ඇති නොවීමත්, මුදල් නොමැති වීමත් වැය ප්‍රතිපාදන වියදම් නොවී ඉතිරිවීමට හේතුව බව පෙන්වා දෙමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06 කට අදාලව එකතුව රු. 458,500 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 80 සිට සියයට 94 දක්වා පරාසයක ඉතිරි වීම් තිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | ඉදිරි අයවැය ලේඛනයේදී මෙම වැය විෂයයන්ට ප්‍රතිපාදන වෙන් කිරීම අඩු කිරීමට සටහන් කර ගතිමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 මාර්තු 29 දින සිට විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |